# නාලන්දා විද්‍යාලය - කොළඹ 10

## ඒකක පරීක්ෂණය

NALANDA VIDYALAYA COLOMBO 10

| 11 ශ්‍රේණිය | නාට්‍ය හා රංග කලාව | 01 ඒකකය |
|---|---|---|

- **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**
- **1.1 - ප්‍රාසංගික කලා**

01. ප්‍රාසංගික කලා පමණක් අන්තර්ගත වරණය තෝරන්න.
    (1). නර්තනය, චිත්‍ර, මූර්ති, ඔපෙරා
    (2). සංගීතය, චිත්‍ර, කැටයම්, නර්තනය
    (3). නර්තනය, නාට්‍ය, සංගීතය, ඔපෙරා
    (4). සංගීතය, නාට්‍ය මූර්ති, ගීත නාට්‍ය

02. ප්‍රාසංගික කලාවක් වන රූකඩ නාට්‍යයේ ප්‍රධාන ශිල්පියා,
    (1). පොතේගුරා (2). කාරියකරවන රාල (3). සූත්‍රධාර (4). බහුභූතය

03. ඔපෙරා නාට්‍ය කලාවේ වඩාත්ම කැපීපෙනෙන මාධ්‍ය වන්නේ,
    (1). ගායනය (2). රංගනය (3). නර්තනය (4). මුද්‍රා

04. ඔපෙරා සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය තෝරන්න.
    (1). ජීවමාන කලාවකි
    (2). ගායනය වැදගත් වේ
    (3). සංගීතය යොදාගනිමින් සිද්ධියක් නිරූපණය කරයි
    (4). පසුතලය භාවිතා කරයි

05. ශ්‍රී ලංකාවේ දක්ෂ ඔපෙරා ශිල්පියෙකු වන්නේ,
    (1). ප්‍රේමසිරි කේමදාස මහතා
    (2). චිත්‍රසේන මහතා
    (3). පණීභාරත මහතා
    (4). එදිරිවීර සරච්චන්ද්‍ර මහතා

06. පහත සඳහන් කලාවන් අතරින් ප්‍රාසංගික කලාවක් නොවන්නේ,
    (1). මූර්ති (2). සංගීතය (3). මුද්‍රා නාට්‍ය (4). ඔපෙරා

07. චිත්‍ර කලාවේ මාධ්‍ය වන්නේ,
    (1). සංගීතය (2). වර්ණ, රේඛා, හැඩතල (3). නාදය (4). පැන්සල්

08. නාට්‍ය ප්‍රේක්ෂකයා වෙත ගෙන යන්නේ,
    (1). අභිනය මගින් (2). චලන මගින් (3). හැඩතල මගින් (4). පිටපත මගින්

09. වේදිකා නාට්‍යයකට ආවේණික ගුණාංගයක් වන්නේ,
    (1). ප්‍රේක්ෂක ප්‍රතිකචාර ලැබීම
    (2). සජීවී බව
    (3). සතර අභිනය භාවිතය
    (4). නිර්මාණය නැවත නැවත වෙනස් කර නොහැකි වීම

10. නාට්‍ය කලාව පිළිබඳ වැරදි කියමන වන්නේ,
    (1). විධග්ධ කලාවකි
    (2). සාමූහික කලාවකි
    (3). දෘශ්‍ය කලාවකි
    (4). සජීවී කලාවකි

- **1.2 - රංගලෝකය**

11. චරිතයක් සෙසු චරිතයන්ගෙන් මතුකර පෙන්වීම සඳහා යොදා ගනු ලබන පහන් වර්ගය වන්නේ,

    (1). ධාරා පහන් (2). යොමු පහන් (3). බැටින් ලාම්පුව (4). ඩිමරය

12. ගගනිකව ආලෝකමත් කිරීම සඳහා යොදාගනු ලබන පහන් වර්ගය වන්නේ,

    (1). ස්ට්‍රිප් ලාම්පුව (2). බැටින් ලාම්පුව (3). ඩිමරය (4). වර්ණ චක්‍රය

13. නාට්‍යයක ආලෝකය සැලසුම් කිරීමේදී සැලකිලිමත් විය යුතු කරුණක් වන්නේ,

    (1). නාට්‍ය සංගීතය කෙරෙහිය (3). ශබ්ද පරිපාලනය කෙරෙහිය

    (2). ප්‍රේක්ෂකයා කෙරෙහිය (4). ඇඳුම් නිර්මාණය කෙරෙහිය

14. මුල්වරට නූතන රංගලෝකය භාවිත කරන ලද්දේ,

    (1). නාඩගම්වලය (2). නූර්තිවලය (3). කෝලම්වලය (4). සොකරිවලය

---

## <u>II කොටස</u>

- **සියළු ප්‍රශ්න සඳහා පිළිතුරු සපයන්න.**

- **1.1 - ප්‍රාසංගික කලා**

01. ප්‍රාසාංගික කලාවක මූලික ලක්ෂණ ලියන්න.
02. ප්‍රාසාංගික කලා යන්න නිර්වචනය කරන්න.
03. ප්‍රාසාංගික කලාංග 4ක් ලියන්න.
04. දෘශ්‍ය කලා යනු මොනවාද?
05. දෘශ්‍ය කලා හා ප්‍රාසාංගික කලා අතර වෙනස පැහැදිලි කරන්න.
06. ප්‍රාසාංගික කලාංග අතරින් නාට්‍ය කලාව සුවිශේෂී වීමට හේතු ලියන්න.
07. නාට්‍ය යනු සාමූහික කලාවන්ගේ එකතුවකි. එහි සත්‍ය අසත්‍යතාව ලියන්න.

- **1.2 - රංගලෝකය**

08. ''රංගාලෝකනය'' යන්න කෙටියෙන් ලියන්න.
09. අතීතයේ සිට වර්තමානය දක්වා රංගාලෝකය භාවිතා කළ ආකාරය විස්තර කරන්න.
10. නාට්‍යයක් සඳහා රංගාලෝකය යොදා ගන්නේ මන්දැයි පැහැදිලි කරන්න.
11. නාට්‍යයක් සඳහා යොදා ගන්නා ආලෝක උපකරණ මොනවාද?
12. නාට්‍යයක් සඳහා භාවිතා කරන පහන් වර්ග මොනවාද?
13. එම පහන් වර්ග අතරින් වේදිකා නාට්‍යයක් රඟ දැක්වීමේදී භාවිතා කරන ප්‍රධාන පහන් වර්ග මොනවාද?
14. ගලායන එළිය යන අර්ථය ඇත්තේ කුමන පහන් වර්ගයේද?
15. වේදිකාවේදී ප්‍රධාන නළුවෙකු ඉස්මතු කිරීම සඳහා යොදාගනු ලබන පහන් වර්ගය කුමක්ද?
16. මුළු වේදිකාවම ආලෝකවත් කිරීම සඳහා යොදාගන්නා පහන් වර්ගය කුමක්ද?
17. වේදිකාවේ දී ආලෝකය පාලනය කරන උපකරණය වන්නේ කුමක්ද?
18. ආලෝක සැලසුම්පත යනු කුමක්ද?

- **1.3 - වේෂ භූෂණ**

19. වේෂ භූෂණ යන්න පැහැදිලි කරන්න.
20. වේෂ භූෂණ මගින් නාට්‍යයකට ලැබෙන දායකත්වය ලියන්න.
21. වේෂ භූෂණ නිර්මාණයේදී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද?
22. නාට්‍යයකට වේෂ භූෂණ යොදා ගැනීමේ වැදගත්කම ලියන්න.

- **1.4 - අංග රචනය**

23. අංගරචනය යන්න නිර්වචනය කරන්න.
24. ප්‍රධාන අංගරචන ප්‍රභේද කීයද?
25. ඒවා ලියන්න.
26. අංගරචනයේදී මුහුණේ මූලික බෙදා දැක්වීම් රූප සටහන් මගින් ඇඳ දක්වන්න.
27. ඔබ අංගරචන ශිල්පියෙකු යැයි සිතා නාට්‍යයක් සඳහා අංගරචනය කිරීමට ලැබුණහොත් අංගරචනය කරන ආකාරය ලියන්න.
28. අංගරචනයේදී සැළකිලිමත් විය යුතු කරුණු මොනවාද?
29. ලෝක ධර්මී නාට්‍යයක අංගරචනය, නාට්‍ය ධර්මී නාට්‍ය අංගරචනයත් අතර වෙනස පැහැදිලි කරන්න.

- **1.5 - සංගීතය**

30. නාට්‍ය සංගීතය අයත් වන්නේ කුමන අභිනයටද?
31. නාට්‍ය සංගීතය නාට්‍යයක් සඳහා අත්‍යාවශ්‍ය ද නැද්ද යන්න විස්තර කරන්න.
32. නාට්‍යයක් සඳහා සංගීතය යොදා ගනීමේදී සැළකිලිමත් විය යුතු කරුණු මොනවාද?

- **1.6 - රංග රචනය**

33. රංග වින්‍යාසය යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.
34. වේදිකා නාට්‍යයක් සඳහා රංග වින්‍යාසය යොදා ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද?
35. රංග භූමි අලංකරණය යන්න පැහැදිලි කරන්න.
36. රංග භූමි අලංකරණයේදී සැලකිලිමත් විය යුතු කරුණු මොනවාද?

- **1.7 - ප්‍රේක්ෂක සහභාගීත්වය**

37. ප්‍රේක්ෂකයා යනු කවරෙක්ද?
38. නාට්‍යයක් සඳහා ප්‍රේක්ෂක ප්‍රතිචාර අවශ්‍ය වන්නේ මන්දැයි ලියන්න.